රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 327(I)

28

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.
1986 ජූනි මස 16 වැනිදින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**1986 නව වැටුප් - වැටුප් පරිමාණයන්හි උපරිමයේ රැඳීසිටීමේ සීමාවන් ඉවත් කිරීම - 1986.05.02 දිනැති අංක.327 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට සංශෝධන**

1986.05.02 දිනැති අංක.327 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පහත දැක්වෙන පරිදි සංශෝධනය කෙරේ.

1. 5 ඡේදයේ (iv) වැනි උප ඡේදය ලෙස එකතු කරන්න.

   "මෙම ඡේදය යටතේ වැටුප් පරිවර්තනය කිරීමෙන් අනතුරුව 1985.12.31 දිනට සේවයේ යෙදී සිටි සියළුම නිලධාරීන්ට 1986.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, 1986 නව වැටුප් මත තවත් එක් වැටුප් වර්ධකයක් දිය යුතුය."

2. 1985.12.31 වැනි දිනට තම වැටුප් පරිමාණයේ උපරිමයේ රැඳී සිටි නිලධාරියෙකු අවසාන වරට ලැබූ වැටුප 1986 නව වැටුප්වල අදාල වැටුප් පරිමාණයේ, වැටුප් පියවරකට අනුරූප නො වන විට, එම නිලධාරියා 1986 නව වැටුප්වල අදාල වැටුප් පරිමාණයේ ඊළඟ ආසන්න ඉහළ පියවරේ තැබිය යුතුය.

3. 1986 නව වැටුප්වලට පරිවර්තනය කිරීමෙන් අනතුරුව, නිලධාරියෙකුගේ වැටුප් වර්ධක ප්‍රමාණය පෙරට වඩා අඩුනම්, එබඳු නිලධාරියෙකුට එකී වෙනස, පාඩුව මැකීයන තෙක් ගෙවිය යුතුය. 1986 නව වැටුප්වල වැටුප් වර්ධක ප්‍රමාණයට වඩා වැඩි වැටුප් වර්ධක ප්‍රමාණයක් අනාගත දිනයකදී හිමි නිලධාරියෙකුටද මෙය අදාල විය යුතුය.

4. 1982.01.01 දිනට පෙර පත්කරන ලද නිලධාරියෙකු සම්බන්ධයෙන් පමණක්, 1981.12.29 දිනැති අංක.197 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි, එක් එක් වැටුප් පරිමාණයෙහි දකුණු පස දක්වා ඇති තාවකාලික වැටුප් සැකසුම 1985.12.31 දිනට පැවති වැටුපට එකතුකොට, අනතුරුව වැටුප් පරිවර්තනය කළ යුතුය.

5. දෛනික වැටුප් ලබන නිලධාරීන් සම්බන්ධයෙන්, 1982.03.26 දිනැති අංක.197(iv) දරණ චක්‍රලේඛයෙහි 3 වැනි ඡේදයෙහි විධිවිධාන තවදුරටත් අදාල වේ.

Siriwardhana

ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.